Page 3 September 2008.qxd 18/09/2008 16:37 Page 1



# සීලවිමල හිමි අභිනන්දන උත්සවය




## Felicitation Ceremony for Venerable Bogoda Seelawimala Nayaka Thero of London Buddhist Viharaya



On the 16th August 2008, the Resident Monks, the Vihara Management Committee and the Coordinators of the London Buddhist Vihara arranged a Felicitation Ceremony at the Vihara for Venerable Bogoda Seelawimala Nayaka Thera in connection with his appointment as the Chief Sangha Nayaka of Great Britain. This appointment was made by the Supreme Sangha Council of Malwatta Chapter of Sri Lanka at Maltwatta Maha Viharaya in Kandy, Sri Lanka on 2nd May 2008. Many distinguish guests including venerable monks from all the Buddhist temples in UK, Sri Lankan Foreign Minister Rohitha Bogollagama and the Sri Lanka High Commissioner in the UK, HE Justice Nihal Jayashinghe attended this event.

පසුගිය අගෝස්තු මස 16 වෙනි දින ලන්ඩන් බෞද්ධ විහාරවාසී භික්ෂූන් වහන්සේලා ද, එහි දායක සභාවද එකතුව ලන්ඩන් විහාරා ධිපති පූජ්‍ය බෝගොඩ සීලවිමල ස්වාමීන් වහන්සේට මල්වතු මහා විහාරයේ උත්තරීතර සංඝසභාව මගින් මහා බ්‍රිතාන්‍යයේ සංඝනායක ධූරය පිරිනැමීම නිමිත්තෙන් උන්වහන්සේ වෙනුවෙන් අභිනන්දන උත්සවයක් ලන්ඩන් විහාරයේ දී පවත්වන ලදී. මේ සඳහා එක්සත් රාජධානියේ බෙහෝ විහාරවලින් භික්ෂූන් වහන්සේලා වැඩමකර සිටි අතර, එයට සහභාගිවූ විශේෂ අමුත්තන් අතර ශ්‍රීලංකා විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම මහතාද, ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස්, විනිසුරු නිහාල් ජයසිංහ මහතාද වූහ. අති විශාල පිරිසක් සීලවිමල ස්වාමීන්-වහන්සේට සුබපැතීමට විහාරයට රැස්ව සිටියේය.

2006 දෙසැම්බර් 15 වෙනිදා ලන්ඩන් විහාරයේ කලින් අධිපති පදවිය දැරූ වජිරඥාණ ස්වාමීන් වහන්සේගේ අභාවයෙන් පසු සීලවිමල හිමියන් ලන්ඩන් විහාරාධිපති වශයෙන් පත්කරන ලදී.

1965 වසරේ පොල්ගහවෙල පාලාගල විහාරයේදී පැවිදිබිමට පිවිසි සීලවිමල හිමියෝ 1972 මල්වතුවිහාරයේදී උපසපන් වූහ. පිළිමතලාව හැරම්ටිගල ශාස්ත්‍රාලංකාර පිරිවෙණෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ උන්වහන්සේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් බී ඒ ගෞරව උපාධිය ලැබූ අතර පසුව හිඳගල මහා විද්‍යාලයේත් මහනුවර ධර්මරාජ විද්‍යාලයේත් ධර්මාචාර්‍යවරයා ලෙස කටයුතු කළහ.

ලන්ඩනයට වැඩම කළ පසු ලන්ඩන් බෞද්ධවිහාරයේ භාවනා පන්ති මෙහෙයවූ සීලවිමල නා හිමියෝ එංගලන්තයේ පාසැල් සහ විශ්වවිද්‍යාලයන්හි ථෙරවාද බුදුදහම පිළිබඳව දේශනද පවත්වා ඇත.

ඉංග්‍රීසි ජාතික අධිකරණ විනිසුරුවරයෙකුවූ ක්‍රිස්මස් හම්ප්‍රි මහතා ලන්ඩනයේ ආරම්භකර ඇති බෞද්ධ සංගමයේ ථෙරවාද බුදුදහම පිළිබඳව අංශාධිපති ලෙස කටයුතු කරන්නේද බෝගොඩ සීලවිමල නායක ස්වාමීන් වහන්සේය. උන්වහන්සේ අභිනවයෙන් ලද සංඝනායක පදවිය මේ බටහිර දේශයට බුදු දහම පැතිරවීමේ කටයුතු සඳහා වැදගත්වනු නිසැකය. භික්ෂුත්වයට ගැලපෙන කරුණාව හා නිහතමානීකමෙන් උන්වහන්සේ පිරිපුන්ව සිටිති.




## බණ්ඩාරනායක හරසර

සේවය මිනිස්දම සිය හදවත ගාවා
සිය සැප අතැර රට දැය වෙත කැප වූවා
.මගෙ මේ සටන පොදු ජන අයිතිය වේවා.
කාහල නදින් තුන් හෙළයම පිබි දූවා

උස් නිදහසක සිතුවිලි උල්පතට මුල
ඉස් තිර බවක ජය සිරි මල් දරන පල
පස් මහ බලය එක තැනකට එකතු කළ
විස් මිත මිනිසෙක්ය ඔහු මුළු ලොව පතල

මානව නිදහසට තම දිවි පරදු කළ
නායක බණ්ඩාර මැතිඳුන් ගුණ විපුල
සිහියට නගන්නේ නැතිනම් අප මෙකල
මිනිසුන් වනු නියත මහ ගුණමකු දුබල

.මගෙ මේ සටන දන සුව පිනිසම වේවා
අසරණකම වහල්කම දියවී යේවා
සාමය සතුට නිදහස ලක ඇති වේවා.
මේවා අපේ උතුමගෙ සිතුවිලි වූවා

සේවය කිරීමයි මිනිසා වෙතට මිනිස්
යුතුකම රන් වදන් තෙපලූ පරිදි වෙසෙස්
දියසෙන් කුමරු බෝසත් ගුණ දරණ උසස්
සිහියට නගා පුදනෙමි හද බැතිනි පසස්

ලොවෙහි ඉපිද ලැබූ මිනිසත්කමට සතූ
කෙලෙහි ගුණ පැම ඉහලින් තිබිය යුතූ
නායක බණ්ඩාර ලක්මව් අනගි පුතූ
සිරිලක් බිමෙහි ඉපදේවා! නැවත මතූ



ශ්‍රීලංකාවේ පොදු ජන යුගයක් උදා කළ අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා දිවංගතව මෙම මස 26 වෙනි දිනට වසර 49 ක් සම්පූර්ණ වෙයි. මේ කවි පන්තිය එතුමන්ගේ ගෞරවනීය නාමයට උපහාරයකි.

**කරුණා බස්නායක**
**Hampstead**
**London**

